5 ශ්‍රේණිය - සිංහල

දෙවන වාරය- සිසු සටහන 19

<u>අප්‍රාණවාචී ඒකවචන උක්ත පද/බහුවචන උක්ත පද සහිත වර්තමාන කාල වාක්‍ය ලිවීම</u>

**අහස සහ පරිසරය**

වටපිටාව බෙහෙවින් සුන්දර ය. ඉහළ අහසත් සුන්දර ය. අවට වටපිටාව ද එලෙස ය. ඈත අහසේ වලාකුළු ඒ මේ අත පාවෙයි. එක්වර ම විශාල වලාකුළක් ඈතින් පැමිණෙයි. සියලු ම පුංචි වලාකුළු විශාල වලාකුළුවලින් වැසෙයි. උදෑසන හිරු ද විශාල වලාකුළකට වැසෙයි. හිරු ටිකෙන් ටික පෙනෙයි. මුළු පරිසරය ම එක් වර ම ආලෝකවත් වෙයි. කුරුල්ලෙක් ඉහළ අහසේ ඉගිලෙයි. ඒ කුරුල්ලා තම කැදැල්ලෙන් පිට ව කෑම සොයා යයි. අවට පරිසරය තව තවත් එළිය වෙයි. විවිධ වර්ණයෙන් යුත් මල් පිපෙයි. සමන් පිච්ච මල් පඳුරේ මල් එක දෙක පිපෙයි. සමන් පිච්ච මල් සුවඳ දසත පැතිරෙයි. රෝස පඳුරේ රෝස මලක් පිපෙයි. පැණි කුරුල්ලා රෝස මල දෙසට පියාඹයි. මුළු පරිසරය ම ටිකෙන් ටික කලබලකාරී වෙයි.

➢ **ඡේදයේ සඳහන් අප්‍රාණවාචී ඒකවචන උක්ත පද සහ බහුවචන උක්ත පද යෙදෙන වාක්‍ය තෝරා ලියන්න**

| අප්‍රාණවාචී ඒකවචන උක්ත පද | අප්‍රාණවාචී බහුවචන උක්ත පද |
|---|---|
| | |